" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 — SLAB ACCREDITED — ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No: CSWP/FIN-AP/03/FI/10(B) — ඔබේ අංකය / உமது இலக்கம் / Your No: — දිනය / திகதி / Date: 2019.08. 15

## <u>මූල්‍ය චක්‍රලේඛ 05/2018(iv)</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරීවල සභාපතිවරු (බ.ප.)

### <u>සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය.</u>

උක්ත මැයෙන් යුතු මගේ 2018.02.26 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 05/2018, 2018.07.24 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 05/2018(1), 2018.11.27 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 05/2018 (11) ට සහ 2019.03.18 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 05/2018 (111) ට අමතර වශයෙනි.

02. ඉහත චක්‍රලේඛ මඟින් සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීමට අදාල වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018, 01/2018(1) සහ 01/2018(11) පළාතට අදාල කර ගෙන ඇත.

03. සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීමට අදාලව මහා භාණ්ඩාගාර ලේකම් විසින් 2019.07.08 දිනැතිව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018(3) නිකුත් කර ඇත.

04. එම චක්‍රලේඛය බස්නාහිර පළාතට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර එහි පිටපතක් මේ සමඟ අමුණා එවමි.

05. එම වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018(3) හි 02.ඡේදයේ හා 03.වැනි ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

I. ඒ අනුව 2019.08.01 දිනෙන් පසු සෑම බලපත්‍රයක් නිකුත් කරන විටදීම එම බලපත්‍රයේ තොරතුරු ඇතුලත් වෙනම වාර්තාවක් නිකුත් කරන අතර, එම වාර්තාව බලපත්‍රලාභියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර තිබිය යුතුය. ඔහු/ඇය යලි කාලය සම්පූර්ණ වී නැවත බලපත්‍රයක් ඉල්ලුම්කරන විට එම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කල වාර්තාවේ ඡායා පිටපතක් ආයතන ප්‍රධානියා සත්‍ය පිටපතක් බවට සහතික කර අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුවේ.

II. 2015.11.21 දිනෙන් පසු සහ 2019.08.01 දිනට පෙර නිකුත් කල බලපත්‍ර සඳහා පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුලත් කිරීම සඳහා ඉහත I හි සඳහන් වාර්තාවක් මෙතෙක් ඉදිරිපත් කර නොමැති නිසා එම වාර්තා ඉදිරියේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය) විසින් ඔබ වෙත එවීමට කටයුතු කරනු ඇත. එසේ එවූ පසු එම වාර්තාව අදාල බලපත්‍රලාභියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වේ.

III. ඉහත II හි සඳහන් වාර්තාව එවීමට පෙර, 2015.11.21 දිනෙන් පසු බලපත්‍රයක් ලබා ඇති ඕනෑම බලපත්‍රලාභියකුට අවශ්‍ය නම්, අදාල ලේකම්වරයා මඟින් කරනු ලබන ඉල්ලීමක් මඟින් එම වාර්තාව ලබා ගත හැකිවේ.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති.
02. බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.
03.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
04.තොරතුරු තාක්ෂණ නිලධාරි.

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office } (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019.07. 08

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 1/2018 (3)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**<u>සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය</u>**

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමට අදාල අංක 01/2018 (1) සහ 01/2018 (2) දරන චක්‍රලේඛ මගින් සංශෝධිත අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 2.6, 8.2 සහ 8.2.ii වගන්ති පහත පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

**01. 2.6. වගන්තියට පහලින් "2.6.1" වශයෙන් පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.**

"2.6.1 2015.11.21 දින හෝ එදිනෙන් පසුව ක්‍රියාත්මකව පැවති කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ නිකුත් කල බලපත්‍රයක් මගින් මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එකී බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතනයේ බලධරයා විසින් එම බලපත්‍රයට අදාල අයදුම් පත්‍රය අනුමත කල දින සිට වසර පහක (05) ක සක්‍රීය සේවා කාලයක් ඉක්මවා නොමැති නිලධාරීන් ".

**02. 08.02.ii වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.**

"08.02.ii පළමු වරට නොවන වාරයකදී බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී

(අ). 2015.11.20 දින හෝ එදිනට පෙර නිකුත් කල බලපත්‍රයක් මගින් ලබා ගත් මෝටර් රථය සඳහා විවෘත කරනු ලැබූ ණයවර ලිපියේ ඡායා පිටපත / දේශීයව එකලස් කරනු ලබන වාහනයක් නම් එය මිල දී ගැනීම සඳහා මුල් වාරිකය ගෙවූ රිසිට් පතෙහි ඡායා පිටපත,

(ආ). 2015.11.21 දින හෝ එදිනෙන් පසුව නිකුත් කල බලපත්‍රයක් මගින් මෝටර් රථයක් ලබා ගත් නිලධාරියෙකු, එම බලපත්‍රය සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍රයට ඉහත "2.6.1" හි සඳහන් කර ඇති "බලධාරියා" විසින් අනුමැතිය ලබා දී ඇති දිනය පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් සහතික කර නිකුත් කරනු ලබන සහතිකයක් හෝ අයදුම්පතෙහි අදාල කොටසේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායා පිටපතක් ".

03. **"8.2.vi"** වශයෙන් පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.

"8.2.vi. ඉහත පරිදි ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතනයේ බලධාරියා අනුමත කිරීමෙන් පසුව එහි ඡායා පිටපතක් අදාල නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කල යුතුය".

04. 2018.02.15 දිනැති අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සහ එහි සංශෝධිත චක්‍රලේඛයන්හි සඳහන් අනෙකුත් සියළු විධිවිධාන නොවෙනස්ව පවතී.

**ආර්.එච්.එස්. සමරතුංග**
**මහා භාණ්ඩාගාරයේ ලේකම් හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්**

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | විගණකාධිපති | - අ.ක.ස |
| 02. | මහ බැංකුවේ අධිපති | - අ.ක.ස |
| 03. | අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | - අ.ක.ස |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | - අ.ක.ස |
| 06. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | - අ.ක.ස |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | - අ.ක.ස |
| 08. | කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | - අ.ක.ස |
| 09. | කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | - අ.ක.ස. |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | - අ.ක.ස. |